**ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

---

ශීර්ෂය 233 - ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූලි 11 දින ආණ්ඩුවේ රස පරීක්ෂක වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම්වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

---

**2.1 විසර්ජන ගිණුම**

---

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

---

දෙපාර්තමේන්තුව සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 660.50 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 610.35 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තුව වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 50.15 ක් හෙවත් සියයට 7.59 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 248.25 | 244.65 | 3.60 | 1.45 |
| මූලධන | 412.25 | 365.70 | 46.55 | 11.29 |
| **එකතුව** | **660.50** | **610.35** | **50.15** | **7.59** |

**2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දෙපාර්තමේන්තුවට අදාළ විෂය අංක 23301 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 8.50 | 4.86 | 4.50 | 6.22 | 32.00 | 18.09 |

**2.3 පොදු තැන්පත් ගිණුම්**

දෙපාර්තමේන්තුව යටතේ වන පොදු තැන්පත් ගිණුම් 03 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 2.13 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු. මිලියන** |
| 6000/0000/00/0016/0003/000 | 1.60 |
| 6000/0000/00/0018/0004/000 | 0.49 |
| 6000/0000/00/0020/0051/000 | 0.04 |
| **එකතුව** | **2.13** |

**2.4 විගණන නිරීක්ෂණය**

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ඇප ලේඛනයක් පවත්වා නොතිබුණි.

## 3.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය

---

විෂය අංක 23301 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශනය සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) 2016 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශනය අනුව තථ්‍ය හර ශේෂය හා දෙපාර්තමේන්තුවේ පොත් අනුව හර ශේෂය අතර රු.377,672 ක වෙනසක් පැවතුණි.

(ආ) විගණනයට ඉදිරිපත් කළ සැසඳුම් ප්‍රකාශනය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ණය ශේෂවල එකතුව රු.30,554 ක්වූ අතර වර්ෂ 01 ක සිට වර්ෂ 05 ක් දක්වා කාල පරාසයක සිට පැවැත එමින් තිබුණද, එම හිඟහිටි ණය ශේෂ අයකර ගැනීමට දෙපාර්තමේන්තුව අපොහොසත් වී තිබුණි.

## 3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

---

**අභ්‍යන්තර විගණනය**

---

වාර්ෂික අයවැය ඇස්තමේන්තුවෙන් දෙපාර්තමේන්තුව සඳහා රු.මිලියන 654.5 ක ප්‍රතිපාදන සලසා තිබුණි. දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලයෙන් 237 ක් සේවා සපයන අතර ජංගම නොවන වත්කම්හි අගය රු.මිලියන 2017.11ක් විය. එසේ වුවද මුදල් රෙගුලාසි 133 ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි. අදාළ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය මගින්ද ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

## 3.4 වත්කම් කළමනාකරණය

---

දෙපාර්තමේන්තුවේ වත්කම් සම්බන්ධයෙන් සිදුකළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) දෙපාර්තමේන්තුව සතු වාහන 04 ක් වර්ෂ 02 ක කාලයක සිට නිෂ්ක්‍රීයව පැවැතුණි.

(ආ) සංවර්ධන මූල්‍ය දෙපාර්තමේන්තුව සතු වාහනයක් විධිමත් පරිදි පවරා නොගෙන වර්ෂයකට වඩා වැඩි කාලයක සිට පරිහරණය කරමින් තිබුණි.

## 3.5 අනුකූල නොවීම්

---

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---

දෙපාර්තමේන්තුව සතු වාහන 06 කට සිදු වී තිබුණු අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 (1) හි දැක්වෙන විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3.6 කාර්යසාධනය

---

දෙපාර්තමේන්තුව වෙත පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කිරීම සඳහා ලැබී තිබුණු ආදර්ශනවලින් 2016 ජනවාරි 01 දින වන විට පරීක්ෂා කිරීමට ආදර්ශන 3,955 ක් තිබුණි. සමාලෝචිත වර්ෂයේදී ආදර්ශන

30,772 ක් ලැබී තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී ආදර්ශන 34,727 ක් පරීක්ෂා කළ යුතුව පැවතුණි. ඉන් ආදර්ශන 29,783 ක් පමණක් පරීක්ෂා කර වාර්තා ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව 2016 දෙසැම්බර් 31 දින වන විට තවදුරටත් ආදර්ශන 4,944 ක් 2017 වර්ෂයේදී පරීක්ෂා කළ යුතුව තිබුණි. 2017 වර්ෂයේදී පරීක්ෂා කළ යුතු ආදර්ශනවල කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| **පරීක්ෂා නොකර අතරැදී ආදර්ශනවල කාලය** | **ආදර්ශන ගණන** | **අතරැදී ආදර්ශන ගණනේ ප්‍රතිශතයක් ලෙස** |
|---|---:|---:|
| වර්ෂ 01 කට අඩු | 3,219 | 65.1 |
| වර්ෂ 01 වැඩි වර්ෂ 03 කට අඩු | 1,133 | 22.9 |
| වර්ෂ 03 කට වැඩි වර්ෂ 05 කට අඩු | 253 | 5.1 |
| වර්ෂ 05 කට වැඩි වර්ෂ 10 කට අඩු | 305 | 6.2 |
| වර්ෂ 10 කට වැඩි | 34 | 0.7 |
| **එකතුව** | **4,944** | **100.0** |

## 3.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** |
|---|---|---:|---:|---:|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 91 | 82 | 09 |
| (ii) | තෘතියික මට්ටම | 10 | 03 | 07 |
| (iii) | ද්විතියික මට්ටම | 119 | 87 | 32 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 78 | 65 | 13 |
| | **එකතුව** | **298** | **237** | **61** |

2016 දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 09 ක් ඇතුළුව තනතුරු පුරප්පාඩු 61 ක් පැවති අතර ඉන් පුරප්පාඩු 07 ක් සඳහා වර්ෂයකට වඩා වැඩි කාලයක සිට වැඩ බැලීමේ පදනම මත නිලධාරීන් පත්කර වැඩ බැලීමේ දීමනා ගෙවා තිබුණි. සමාලෝචිත වර්ෂයේදී පමණක් එලෙස ගෙවා තිබුණු වැඩ බැලීමේ දීමනාවල එකතුව රු.334,224 ක් විය.